## මුදල් මණ්ඩලය
## ශ්‍රී ලංකා මහ බැංකුව

**2021 මාර්තු 19** **චක්‍රලේඛය** **2021 අංක 05**

### කොවිඩ්-19 නිසා බලපෑමට පත් සංචාරක ක්ෂේත්‍රයේ නියුතු ව්‍යාපාර හා පුද්ගලයින් වෙත ලබා දුන් ණය සහන කාලය දීර්ඝ කිරීම

පවත්නා කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ, සංචාරක ව්‍යාපාරයේ නිරත ව්‍යාපාර හා පුද්ගලයන් විසින් මුහුණදෙනු ලබන අභියෝගයන් සැලකිල්ලට ගනිමින් 2020 සැප්තැම්බර් 30 වැනි දින නිකුත් කරන ලද 2020 අංක 09 දරන චක්‍රලේඛය මගින් සංචාරක ක්ෂේත්‍රය වෙත පිරිනමන ලද ණය සහන කාල සීමාව, 2021 අප්‍රේල් 1 දින සිට පහත සඳහන් පරිදි, තවත් මාස හයක කාලයක් සඳහා දීර්ඝ කරන මෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් (මින් මතුවට බැංකු නොවන මූල්‍ය ආයතන ලෙස හැඳින්වෙන) වෙතින් ඉල්ලා සිටී. කෙසේ වෙතත්, ගනුදෙනුකරුවන් විසින් සිදුකරනු ලබන ඉල්ලීම් මත පදනම්ව මෙම චක්‍රලේඛය මගින් පිරිනමනු ලබන සමස්ත ප්‍රතිලාභයන්ට වඩා අඩු නොවන පරිදි, ගනුදෙනුකරුවන් වෙත වෙනත් අමතර විකල්පයන් පිරිනැමීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන හට අවස්ථාව ඇත. ඉහත ණය සහන කාලසීමාව දීර්ඝ කිරීම සිදු කරනු ලබන්නේ ගනුදෙනුකරුවන්හට දීර්ඝ කාලීන වැඩපිළිවෙලක් සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබාදීමේ අවශ්‍යතාවය මත වන අතර, ගනුදෙනුකරුවන් විසින් මෙම දීර්ඝ කරන ලද ණය සහන කාලය අවසන් වීමට පෙර, තම ණය පහසුකම් දීර්ඝ කාලයක් සඳහා ප්‍රතිව්‍යුහගත කිරීමට පිළිගත හැකි සැලැස්මක් බැංකු නොවන මූල්‍ය ආයතන වෙත ඉදිරිපත් කළ යුතුය. බැංකු නොවන මූල්‍ය ආයතන විසින් එවැනි සැලසුම් ඒ ඒ අවස්ථානුකූලව සලකා බැලීමට කටයුතු කළ යුතු අතර, ඉහත ණය සහන යෝජනාක්‍රමය සියලු බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ඒකාකාරීව ක්‍රියාවට නැංවීම තහවුරු කිරීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

2020 අංක 09 දරන චක්‍රලේඛයේ පහත සඳහන් ප්‍රතිපාදන, මෙහි සඳහන් වන ආකාරයට සංශෝධනය වනු ඇති අතර, එම චක්‍රලේඛයේ අනෙකුත් ප්‍රතිපාදනයන් නොවෙනස්ව පවතී.

**1. පොදු කොන්දේසි හා නියමයන්**

1 (iii) ණය සහන කාලය යනුවෙන් අදහස් කෙරෙන්නේ 2021 අප්‍රේල් 01 දින සිට 2021 සැප්තැම්බර් 30 වැනි දින දක්වා තවත් මාස හයක කාලසීමක් සඳහා මූලික ණය මුදල සහ පොලිය කල් තැබීම වේ.

1 (iv) මෙම ණය සහන ලබා ගැනීමට අපේක්ෂා කරන, සුදුසුකම් ලබන ණය ගනුදෙනුකරුවන් 2021 අප්‍රේල් 19 දින හෝ ඊට පෙර සිය බැංකු නොවන මූල්‍ය ආයතන වෙත ඉල්ලීමක් කළ යුතුය. කෙසේ වෙතත්, ගනුදෙනුකරුවන් විසින්, 2021 අප්‍රේල් 19 දිනෙන් පසුව කරනු ලබන ඉල්ලීම් සාධාරණ හේතු මත සලකා බැලීමට කටයුතු කරන මෙන් බැංකු නොවන මූල්‍ය ආයතන වෙත දන්වා සිටී. බැංකු නොවන මූල්‍ය ආයතන විසින් 2021 මැයි 31 දිනට පෙර

නියමයන් හා කොන්දේසි සම්පාදනය අවසන් කර සුදුසුකම්ලත් ණය ගනුදෙනුකරුවන් සමඟ නව ගිවිසුමකට එළඹිය යුතුය.

1 (vii) ගනුදෙනුකරුවන් විසින් ඉල්ලීමක් කරන්නේ නම් පමණක්, 2020 අංක 03 සහ 2020 අංක 04 දරන විස්තර සටහන්වලට අනුව පොලී රහිත කාලීන ණයෙහි ගෙවීමට ඇති වාරික (එනම්, 2020 අප්‍රේල් 01 සිට 2020 සැප්තැම්බර් 30 දක්වා පළමු ණය සහන කාල සීමාවේ දී උපචිත පොලිය) සහ 2020 අංක 09 දරන චක්‍රලේඛයට අනුව පරිවර්තනය කරන ලද කාලීන ණයෙහි වාරිකය සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන්ගෙන් 2021 ඔක්තෝබර් 01 දින සිට අයකර ගැනීමේ හැකියාව පවතී.

**2. ණය සහන යෝජනාක්‍රමයේ සැකැස්ම**

2 (i) 2021 අප්‍රේල් 01 දින සිට 2021 සැප්තැම්බර් 30 දින දක්වා ණය සහන කාල සීමාව තුල අයවීමට නියමිත මූලික ණය මුදල සහ පොලිය කාලීන ණයකට හැරවීමට බැංකු නොවන මූල්‍ය ආයතන කටයුතු කළ යුතුය.

2 (ii) බැංකු නොවන මූල්‍ය ආයතන විසින් මෙලෙස හරවන ලද ණය යළි අයකර ගැනීම ආරම්භ කිරීම, දීර්ඝ කරන ලද ණය සහන කාලය අවසන් වීමෙන් පසුව සිදු කළ යුතුය.

2 (v) මෙම චක්‍රලේඛය යටතේ සුදුසුකම් ලබන ණය සඳහා, බැංකු නොවන මූල්‍ය ආයතන විසින් 2021 අප්‍රේල් 01 දින වන විට එකතු වී නොපියවා ඇති දඩ පොලී කපා හැරිය යුතුය. තවද, ණය සහන කාල සීමාව තුලදී දඩ පොලී එකතු කිරීම හෝ අය කිරීම නොකළ යුතුවේ.

අත්සන් කලේ,

**මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්**

මුදල් මණ්ඩලයේ සභාපති සහ

ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

## වැඩි විස්තර සඳහා කරුණාකර ඔබේ ළඟම ඇති ශාඛාව අමතන්න

**අයිඩියල් ෆිනෑන්ස් - සම්බන්ධතා තොරතුරු**

| ශාඛාවේ නම සහ ලිපිනය | ඇමතුම් විස්තර | ශාඛා කළමනාකරුගේ නම | ශාඛා කළමනාකරු සම්බන්ධතා තොරතුරු |
|---|---|---|---|
| අනුරාධපුර ශාඛාව<br>අංක: 09,<br>ප්‍රධාන වීදිය,<br>අනුරාධපුර | දු.ක. : 025 2237925<br>ෆැක්ස් : 025 2237905 | අකිල ජයතිලක මහතා | ජංගම දුරකථන අංකය<br>0719923730 |
| බණ්ඩාරවෙල ශාඛාව<br>අංක: 339,<br>ජනහිත ගොඩනැගිල්ල,<br>ප්‍රධාන වීදිය,<br>බණ්ඩාරවෙල | දු.ක : 057 2221025<br>ෆැක්ස් : 057 2230030 | නිලංග ජයලත් මහතා | ජංගම දුරකථන අංකය<br>0718643335 |
| එල්පිටියා ශාඛාව<br>අංක 117,<br>ප්‍රධාන වීදිය,<br>ඇල්පිටිය. | දු.ක : 091 2291427<br>ෆැක්ස් : 091 2291428 | ගයාන් මල්ලවාරච්චි මහතා | ජංගම දුරකථන අංකය<br>0714940022 |
| එම්බිලිපිටියා ශාඛාව<br>අංක: 28,<br>පල්ලෙගම පාර,<br>ඇඹිලිපිටිය | දු.ක : 047 2261467<br>ෆැක්ස් : 047 2261468 | චින්තක සෙනෙවිරත්න මහතා | ජංගම දුරකථන අංකය :<br>0703564162 |
| ප්‍රධාන කාර්යාලය<br>අංක: 299,<br>යුනියන් පෙදෙස,<br>කොළඹ 02 | දු.ක : 011 2396060<br>ෆැක්ස් : 011 2396757 | චමත් ජයසිංහ මහතා | ජංගම දුරකථන අංකය :<br>0714940020 |
| යාපනය ශාඛාව<br>අංක: 408,<br>රෝහල් පාර,<br>යාපනය | දු.ක : 021 2219990<br>ෆැක්ස් : 021 2219991 | කනගනාදන් සුගන්තන් මහතා | ජංගම දුරකථන අංකය:<br>0714940021 |
| මහනුවර ශාඛාව<br>අංක: 119 ඒ,<br>කොටුගොඩෙල්ලා වීඩියා,<br>මහනුවර | දු.ක : 081 2208708<br>ෆැක්ස් : 081 2208709 | සාලියා මාලුදේනියා මහතා | ජංගම දුරකථන අංකය:<br>0718875414 |
| කුරුණෑගල ශාඛාව<br>අංක 33,<br>සුරතිස්ස මාවත, කුරුණෑගල | දු.ක : 037 2232110<br>ෆැක්ස් : 037 2232010 | සමන් ධර්මසිරි මහතා | ජංගම දුරකථන අංකය<br>0714940027 |
| මාතර ශාඛාව<br>අංක: 91,<br>අනගරිකා ධර්මපාල එම්.<br>මාතර | දු.ක : 041 2226916<br>ෆැක්ස් : 041 2226912 | යසිතා නාඩුන් ගේබ්‍රියෙල් මහතා | ජංගම දුරකථන අංකය :<br>0703561472 |
| මොණරාගල ශාඛාව<br>අංක: 100,<br>නව බස් නැවතුම්පොළ,<br>මොණරාගල | දු.ක : 055 2055858<br>ෆැක්ස්: 055 2055588 | රසිකා බන්දර මහතා | ජංගම දුරකථන අංකය :<br>0719923732 |
| ගම්පහ ශාඛාව<br>අංක 03,<br>බෞද්ධෝකා මාවත, ගම්පහ | දු.ක : 033 2121321 / 033 2121421<br>ෆැක්ස් : | නිශාන්ත කන්නංගර මහතා | ජංගම දුරකථන අංකය :<br>0703561458 |